3

IV කොටස—අධ්‍යාපන, විද්‍යා සහ කලා (G)

1958 වර්ෂය සඳහා පුරාවිද්‍යා කොමසාරිස් තැනගේ පාලන වාර්තාව

මැයි, 1960

ප. එ. ප. දැරණියගල මහතා

Part IV—Education, Science and Art (G)

Administration Report of the Archaeological Commissioner for 1958

May, 1960

P. E. P. Deraniyagala, Esq.

වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝර්පරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ආණ්ඩුවේ නියමයෙන් ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

Printed on the orders of Government at the Government Press, Ceylon, on paper manufactured at the Eastern Paper Mills Corporation, Valaichchenai, Ceylon

To be purchased at the Government Publications Bureau, Colombo

මිල *Price* : 1.70 තැපැල් ගාස්තුව *Postage* : -/35

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙටුම්පත ලැබුන දිනය *"Copy" received*	*9. 12. 1959*
පළමුවන ශුද්ධිපත්‍ර යැවූ දිනය *1st Proof sent*	*19. 1. 1960*
පළමුවන ශුද්ධිපත්‍ර ආපසු ලැබුණු දිනය *1st Proof returned*	*19. 2. 1960*
දෙවන ශුද්ධි පත්‍ර යැවූ දිනය *2nd Proof sent*	*25. 2. 1960*
දෙවන ශුද්ධි පත්‍ර ආපසු ලැබුණ දිනය *2nd Proof returned*	*22. 3. 1960*
තෙවන ශුද්ධිපත්‍ර යැවූ දිනය *3rd Proof Sent*	*2. 4. 1960*
තෙවන ශුද්ධිපත්‍ර ආපසු ලැබුණු දිනය *3rd Proof Returned*	*20. 4. 1960*
ප්‍රසිද්ධ කළ දිනය *Published*	*4. 5. 1960*

EVELYN RUTNAM LIBRARY

1——ජේ. ඇන්. ආර් 6721—1,575 (12/59)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
වර්ෂ 1958 සඳහා පාලන වාර්තාව

නියුක්ත පිරිස.—එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන සමාජයීය හා සංස්කෘතික ආයතනයේ අනුග්‍රහ යෙන් ඉතාලි රජයේ පුරාවිද්‍යා පරිපාලක මහාචාර්ය පී. සී. සෙස්තියරි මහතාගේ සේවය 1958 මාර්තු මාසයේ සිට දෙපාර්තමේන්තුවට ලබාගත හැකිවිය. ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ පී. ඊ. පී. දැරණියගල මහතාගෙන් පසුව මහාචාර්ය සෙස්තියරි මහතා 1958 මැයි මස 1 වෙනි දින සිට වැඩබලන පුරාවිද්‍යා කොමසාරිස් හැටියට පත්විය.

කාර්යාල සහකාර එච්. ඒ. පෙරේරා මහතා 58.3.4 දින සිට සේවයෙන් විශ්‍රාම ගත්තේය. ඒ මහතා වෙනුවට විධායක ලිපිකාර පන්තියේ විශේෂ ශ්‍රේණියේ වි. ශ්‍රී. රංගනාදන් මහතා 58.3.6 දින සිට පත්විය.

ජේ. ඇස්. ඒ. උඩුවර මහතා ලංකාවේ ජාත්‍යන්තර කෞතුකාගාර කවුන්සලයට පත්විය.

වැඩ පරීක්ෂක ආර්. වී. ඇම්. කරුණාරත්න මහතා 58.3.1 දින සිට වැඩබලන වැඩ අධිකාරි හැටියට පත්කරනු ලැබීය.

1958 සැප්තැම්බර් මස 30 වැනි දිනෙන් අවසානවූ වර්ෂය සඳහා මුදල් වාර්තාව

ආදායම.—ප්‍රකාශන, ඡායාරූප, පින්තූර සහිත තැපැල්පත් හා සිතියම් ආදිය විකිණීමෙන් රුපියල් 3,921.35ක මුදලක් ලැබිණ. විකිණීම අඩුවීමට ප්‍රධාන හේතුව වූයේ අවුරුද්ද තුළ පැවති හදිසි තත්ත්වයය. විකිණීම් වැඩිකරන හැටියට නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. 1951–52 සිට 1955–56 දක්වා කාලය තුළ ජනප්‍රිය ප්‍රකාශන, මාර්ග විස්තර පොත් හා මුද්‍රිත තැපැල් පත්වලට අදළ අත්තිකාරම් ගිණුමෙන් ලැබුනු ලාභවූ රු. 13,130.71ක මුදලක් ආදායමට අයකරන ලදී.

පුස්තකාලය.—1958 වර්ෂය තුළදී පුස්තකාලය සඳහා පොත් 63ක් මිළදී ගන්නා ලදී. සිංහල කෘතීන් ගණනාවක්ම ඇතුළත් කරන ලදී. අවුරුද්ද තුළ මිළයට ගන්නා ලද විවිධ සඟරාවල හා කලින්කල පළවෙන සඟරාවල ගණන 256ක් වූ අතර විදේශීය හා දේශීය ආයතනයන්ගෙන් ප්‍රකාශන 218ක් හුවමාරුකර ගන්නා ලදී. යුනෙස්කෝ ලංකා ජාතික කොමිසම එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික ආයතනය "ලංකාවේ—විහාරස්ථාන, චෛත්‍ය හා ලෙන් සිතුවම්" නමැති ප්‍රකාශනය පුස්තකාලය වෙත කාරුණිකව ප්‍රදානය කරන ලදී. 1957 පාලන වාර්තාවේ ඉංග්‍රීසි සහ සිංහල පිටපත්, බෙදා හැරීමේ ලැයිස්තුවේ අන්තර්ගත සෑම ආයතනයකටම හුවමාරු වශයෙන් යවන ලදී. කලා හා විද්‍යා සම්බන්ධ පොත් ගණනාවක්ම අනුරාධපුර කෞතුකාගාරයේ, දැදිගම කෞතුකාගාරයේ සහ රසායනාගාරයේ ඇති පුස්තකාලයන්ට එවා තිබේ.

ඡායාරූප ශිල්පය.—වර්ණ ඡායාරූප ගැනීම ආරම්භ කරන ලද අතර, පෞරාණික ස්මාරකයන් හා චිත්‍ර අඟල් $2\frac{1}{4} \times 2\frac{1}{4}$ රේ 120 වර්ණ ඡායාරූප පටලවලට ගන්නා ලදී. එබඳු ඡායාරූප පටල දෙපාර්තමේන්තුවේ කටයුතු ජනප්‍රිය කිරීම සඳහා පවත්වනු ලබන නිදර්ශන සහිත කථාවලදී ප්‍රයෝජනවත් වනු ඇත. අළුත් චිත්‍රඵලක 514ක් එකතු කරන ලදී. සාදන ලද බ්‍රෝමයිඩ්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිටපත් 1,906කින් 152ක් මහජනයාට විකුණන ලදී. මහාචාර්ය ඇස්. පරණවිතාන මහතාගේ ඕනෑකම පරිදි චිත්‍රපිටපත් ගණනාවක්ම ලංකා විශ්ව විද්‍යාලයට සපයන ලදී. කඩදාසියට කොපි කරගත් ශිලාලෙඛන 109ක ස්පර්ශ ලාංඡනයන්ගේ ඡායාරූප ගන්නා ලදුව ඉන් වැඩි හරියක් දැනට ශිෂ්‍යත්වයක් ලබා පිටරට සිටින ඩබ්ලිව්. ඇස්. කරුණාරත්න මහතාට යවන ලදී. අඟල් 20×16 දක්වා විශාල කරන ලද පෞරාණික ස්මාරකයන්ගේ හා පුරාවස්තූන්ගේ ඡායාරූප 23ක් අමාත්‍යාංශය මගින් විතගොංහි ප්‍රදර්ශනයක් සඳහා යවන ලදී.

ප්‍රකාශන.—වැඩ බැලූ පුරාවිද්‍යා කොමසාරිස් වන ප. ඒ. ප. දුරණියගල මහතා විසින් ලියන ලද නව සීගිරි සංදර්ශනය සිංහලෙන් හා ඉංග්‍රීසියෙන් ප්‍රසිද්ධ කරණ ලදී. ප්‍රකාශන සහකාර ඩී. ඇස්. ගුණතිලක මහතා විසින් මිහින්තලයට යන ගමන් විස්තර පොතක අත්සටහනක් සිංහලෙන් පිළියෙල කරණ ලදී. අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ අධිකාරි වන ජේ. ඇස්. ඒ. උඩුවර මහතා විසින් එම කෞතුකාගාරයට අදල වූ සංදර්ශණයක අත්සටහනක් සකස් කරණ ලදී. මේවා ළඟදීම මුද්‍රණද්වාරයෙන් පිටවෙනවා ඇත.

අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයට එකතුකරන ලද දේ—

(අ) කහටගස්දිගිලියේ වෙහෙරගල පුරාණ රජමහා විහාරයෙන් සොයාගන්නා ලදුව කෞතුකාගාර අධිකාරි විසින් සංරක්ෂණය කොට තබාගන්නා ලද කැඩුණු ලෝකඩ පිළිමයක කොටසක් (1956 වර්ෂයේ ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පාලන වාර්තාවේ 6 වැනි කොටස සහ 1 වැනි පින්තූරයද බලන්න).

(ආ) කෙළින් සිටින රූපයක අර්ධ ප්‍රතිමාවක් සහ අනුරාධපුර බෞද්ධ ගරාදි ගොඩ නැඟිල්ලේ කැටයම් සහිත කණුවක්.

(ඇ) කුඩා වෘෂභ රූපයක් කොටන ලද රතු ගලක්.

(ඈ) අලංකෘත ලක්ෂ්මී ඵලකයක්, සංඛ සහ සමන් පිච්ච වර්ගයේ අකයක්, බෝල් සහ ඇනාවුලට් වර්ගයේ ලක්ෂ්මී රූපයක්, රිදී කහවනුවක්, තඹ කහවනුවක්, ගසක්, සහ ස්වස්තික කාසියක් ද වේ.

අනුරාධපුරයේ කැනීම් කටයුතු

පුරාවිද්‍යාත්මක වලං කැබලිති අනුසාරයෙන් අනුරාධපුර පැරණි නගරයේ කාල ප්‍රභෙදයන් මැනීම සඳහා 1957 දී වැඩ ආරම්භ කරණ ලදී. අනුරාධපුර ගෙඩිගේ අසල පස් තට්ටු පරීක්ෂා කිරීමෙන් ලබන ලද ප්‍රතිඵල 1957ට අයත් පාලන වාර්තාවේ සඳහන් කරනලදී. 1957 ඇතිවූ මහා ජලගැල්ම නිසා තාවකාලික වශයෙන් මේ වැඩය ඇණහිටින ලදී. නමුත් 1958 සැප්තැම්බර් 1 වෙනි දින සිට එම පරීක්ෂණ නැවතත් පටන් ගන්නා ලදී. මූලාචාර්ය පී. සී. සෙස්ටෙරි මහතා විසින් මේ ව්‍යාපාරය ක්‍රියාත්මක කොට නිලධාරි මණ්ඩලයටද පස්තට්ටු සහිත බිම් ක්‍රමානුකූලව හෑරීමට පුහුණුවක් දෙන ලදී. මෙම කැණීමේදී සෙස්තියරි මහතාට ජේ. ඇස්. ඒ. උඩුවර මහතාගේ සහායද ලැබුණි.

පේරාදෙණියේ ලංකා විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යාව හා පුරාණ ඉතිහාසය ඉගෙනගන්නා ශිෂ්‍යයින්ටද පුහුණුවීමේ අවස්ථාව ලබාදෙන ලදුව 25 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සැප්තැම්බර් මස 9 වෙනි දින සිට 13 වෙනි දින දක්වා හෑරීමට සහභාගිවූහ. නගරයේ උතුරු කොටසෙහි වූ ඇතුල් බල කොටුවේ "ගෙඩිගේ" නමින් ප්‍රකට ප්‍රදේශය කැණීම සඳහා තෝරාගන්නා ලදී. පොළොව මතුපිට පුරාවස්තු සමහරක් දක්නට ලැබුනේ වී නමුත් මෙම ප්‍රදේශය මෙතෙක් ගවේෂණය නොකරන ලද්දේ වෙයි. ඉහතදී මනුෂ්‍ය වාසයක්ව පැවති බවට හා එහෙයින් ප්‍රයෝජනවත් දේ සොයාගත හැකි බවටත් සාධකයන්වූ කැබලිති හා ගඩොල් කැලි බහුලව තිබීම නිසා මෙම ප්‍රදේශය තෝරාගන්නා ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පහළම තට්ටුව දක්වා ක්‍රමානුකූල හැරීමක් කළ හැකි පොළොවේ සමතලා බව එහි හැරීමක් කිරීමට අප පෙළඹවීය. තට්ටු සහිත බිම් හැරීමේදී කරන සාමාන්‍ය පිළිවෙල අනුව පොළොව මතුපිට රාමුවක් තබා එය දන් ලැල්ලක කොටු වැනි හතරැස් කොටුවලට බෙදන ලදි. එක් එක් ජේළියක අඩි 24ක්වූ කොටු 4කි. පුරාවස්තු ගැබ්වී ඇති පස් තට්ටුවල හරස්කැපුමක් ලැබෙන පරිදි හා පස්තට්ටුවල නියම ඝනකම වටහාගත හැකිවන පරිදි එකී හතරැස් කොටුවලින් සමහරක් නිරිත දිග් භාගයේ සිට හාරා ඒවායේ පස්කණ්ඩි වෙනස් නොකොට තිබෙන්ට හරින ලදි. (අංක 1 දරණ වළ හා I වන චිත්‍රය)

දෙවන, තුන්වන හවන සහ අටවන කොටුවල හැරීම ආරම්භ කරන ලදි. මින් අන්තිමට සඳහන් වූ අටවන කොටුව හැරීම විශ්වවිද්‍යාලීය ශිෂ්‍යයනට පැවරිණ. කාලයේ සීමිත බව නිසා හතරැස් කොටුවේ නිරිත දිග කොටස පමණක් ගවේෂණය කරන ලදි. මේ සඳහා අඩි 6 අහල් 7 දිග් වූ අඩි 5 අහල් 8ක් පළල වළක් සතියකදී අහල් 54ක් ගැඹුරට හාරන ලදි.

1 වන, 2 වන, 3 වන සහ 6 වන වළවල් හැරීම මේ දක්වා කරගෙන යනු ලැබේ. මේ දක්වා (ජනවාරි 15) කරන ලද ගවේෂණවල ප්‍රතිඵල පහත දැක්වේ. පහත සඳහන් හැරීම්වල ප්‍රතිඵල මීලඟ වර්ෂයේ පාලන වාර්තාවේ පළවනු ඇත :—

පළමුවන වළ (උපග්‍රන්ථය II (අ) බලන්න)

සාමාන්‍යයෙන් අහල් 13ක් පමණ ගැඹුරවූ උඩ පස් තට්ටුව, ඉතා වියලි, ගොඩ ගැසුනු තද අඳුරු වර්ණයෙන් යුත් එකක් විය. එය සම්පූර්ණයෙන් හිස්වූ අතර පිහන් කැබලිති ස්වල්පයක් පමණක් දක්නට ලැබිණ. පොළොව මතුපිට සිට අහල් 16ක් ගැඹුරින්, තලාතු මිහිරන්, පබළු ඇට වැනි කැට වර්ගයක් ඇති බවට සළකුණු හා පිහන් ගඩොල් කැබැල්ලක්ද සමුවිණ. නියම පුරාවිද්‍යාව සම්බන්ධ පස් තට්ටුව එනම්, පිහන් කැබලිති රාශියක් සහිත තට්ටුව අහල් 21ක් ගැඹුරින් පටන් ගෙන, දැනට පැමිණ ඇති අඩි 11ක් ගැඹුරකි තැන දක්වා නො වෙනස්ව පවතී. මා දන්නා අන්දමට මේ පස් තට්ටුව ලංකාවේ සමුවූ පළමුවන අවස්ථාව මෙය වේ. (උපග්‍රන්ථය II (ආ) බලන්න.) විවිධ හැඩහුරුකමින් හා ප්‍රමාණයෙන් යුත් භාජනවලට අයත් නා නා වර්ණයෙන් සැරසිල්ලෙන් හා ශිල්පයෙන් යුක්ත නොයෙක් කැබලිති වර්ග හඳුනාගැනීමට මෙය අපට උපකාර විය. දැනට කණින ලද වලවල් වලින් පෙනීගියේ නොයෙක් මට්ටම්වලදී සමුවන කැබලිති එකිනෙකට සමාන බවය. මෙයින් කුඹල් කර්මාන්තය පිළිබඳ එකිනෙකට සම්බන්ධ කාල නිගමනයක් කළ හැක. පසුව, තව තවත් කැණීමේදී, වෙනත් විස්තර ලබාගත හැකි දේ සොයා ගැනීමෙන්, නියම කාල නිගමනයකට පැමිණ ඒ මගින් තවදුරටත් පුරාවස්තු සොයාගැනීමට හැකි වනු ඇත.

එහිත් මෙහිත් දැනට කැණ ඇති අනෙකුත් ආවාට වලිනුත් ඉතා කදිම සොයාගැනීම නම් අනුරාධපුර යුගයේ මුල් භාගයට අයත් සුරකී ඇති ගඩොල් පදිකා හා බිත්තිද වේ. (අංක II චිත්‍රය) මෙහි සඳහන් ප්‍රමාණයන් අනුව ගඩොල්වල කාලය නිගමනය කරගත හැකි බැවින්, ඒවායින් නිමවුණු ගොඩනැගිල්ලේ කාලය දැනගැනීමට එය ප්‍රයෝජනවත් වනු ඇත.

අඩි 5 අහල් 8½ක් ගැඹුරින් දිස්වුණ පළමුවන ගඩොල් බිත්තිය දිගින් අහල් 98ක් හා පළලින් නැගෙනහිර අඩි 21ක් ද විය. එය බටහිර දිසාවෙහි පස් කන්දෙන් පටන් ගන්නා ලද්දකි. වළෙහි බටහිර දිසාවෙන් දෙවන බිත්තියෙහි (ඈ) ශේෂයන්, පිළිවෙලින් අහල් 32ක් හා 26ක්ව සෘජුකෝණාස්‍රව පිහිටා තිබුණි. බිත්තිය ගඩොල් බැමි කොටස් තුනකින් සමන්විතව භූඔස් මැටි උඩ ගොඩ නැගුණු අතර, ඊට යටින් ගඩොලින්ම නිමවූ වේදිකාවක්ද, විය. බිත්තියේ ඉහළ කොටස අඩි 5 අහල් 6ක් ගැඹුරින්ද, පහළම කොටස අඩි 6 අහල් 1ක් ගැඹුරින්ද පිහිටා තිබේ. පදිකාවත් මෙයත් අතර පස් ප්‍රමාණය අහල් 13½ක් උසය. මේ වළෙහි අඩි 4 අහල් 11ක් ගැඹුරට හැරුවිට නැගෙනහිර කොටසෙහිදී ගෝලාකාර පතුලකින්ද, නැමුණු ගැටියකින් හා මුවවිටකින්ද යුත් බඳුනක්, (ඈ) බිත්තියෙහි ඉහළ ගඩොල් කොටස් මට්ටමේදීම සමුවිය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගඩොල් පදිකාවල ශේෂයන් ස්ථාන තුනකින්ම ගොඩගනු ලැබීය. (අ) වේදිකාව (අ) බිත්තිය යටින්ද, පොළෝ තලයෙන් අඩි 7 අඟල් 1½ක් යටින්ද, (ආ) පදිකාව දිගින් අඩි 10 අඟල් 5ක්ද, පළලින් අඩි 6 අඟල් 6ක්ද, තුන්වන වේදිකාවේ (ඇ) ශේෂ පොළොවට අඩි 6 අඟල් 4½ක් යටින්ද, පිහිටා තිබේ. පදිකාව පිටුපසින් තවත් (ඇ) බිත්තියක් (ආ) බිත්තිය කෙළින් පිහිටියේය.

පළමුවන වළේ නැගෙනහිර දෙසින් දිගින් අඩි 5 අඟල් 2ක්ද, පළලින් අඩි 5 අඟල් 5ක්ද, වූ බිම් කැබැල්ලකි. මෙය අඩි 6 අඟල් 4ක් ගැඹුරින්ද, උතුරු කොටසේ මුදුනේ සිට අඩි 7 අඟල් 3ක්ද දුරින්ද. පිහිටන ලද්දකි. මේ බිම් කැබැල්ලේ වැලි ගොඩ ගැසී තිබුණ අතර එහි තිබී අඟුරු කැබලිද සමුවිය. මේ පොළෝතලයට අඩි 6 අඟල් 10ක් යටිනි. (උපග්‍රන්ථ II (ඇ) .)

දෙවන වළ.—1958 අවුරුද්ද අවසානයෙහි, මේ වළේ කොටසක් කැණීම් සම්බන්ධව සඳහන් කෙරුණි.

තුන්වන වළ.—මෙම වළෙන්ද ගඩොල් බිත්තිවල ශේෂයන් සොයාගත හැකිවිය. එයින් පළමුවැන්න, පොළොතලයෙන් අඩි 5 අඟල් 2ක් ගැඹුරින්ද, තවත් දෙකක් ගිණිකොණ දිගින් අඩි 6ක් ගැඹුරින් හා වයඹ දිසාවෙහි මුල්ලෙන් අඩි 5 අඟල් 3ක් ගැඹුරින්ද පිහිටා තිබේ.

හයවන වළ.—මෙහි අඟල් 26ක් ගැඹුරේදී කැට කැබිලිති මහත් රාශියක් විය. ගඩොලින් නිමවූ පදිකාවක හා බිත්තිවල ශේෂයන් මෙහිදී සමුවිය. පළමුවන වළෙන් හමුවූ පදිකාවේ කොටසක් විය හැකි, පොළොව මතුපිටින් අඩි 7 අඟල් 3ක් ගැඹුරින් පිහිටි පෙනුමෙන් ඇද සහිත වූ මෙම පදිකාව නැගෙනහිර දෙසට අඩි 6 අඟල් 11ක් දක්වා විහිදේ. උතුරේ සිට දකුණට විහිදී බටහිර දිසාවෙහි මුදුනට සරල සමාන්තරව සිටින බිත්තියෙහි ගඩොල් බැමි කොටස් නමයක් තිබේ.

අටවන වළ.—මෙය පේරාදෙණියේ ශිෂ්‍යයන්ට භාරකරන ලදි. ක්‍රමවත් කැණීමක් වශයෙන් ඔවුනට ලැබුණ පළමුවන අවස්ථාව වූ මෙයින් හැකිතරම් ප්‍රතිඵල ලබාගැනීමට කායඨික්ෂමව, යහපත් අධිෂ්ඨානයෙන් කම්කරුවන් ලෙස වැඩකළ බැව් කිව යුතුය. ඔවුනට ලැබුණ කෙටි කාලසීමාව නිසා වළේ සවල්ප කොටසක පමණක් කටයුතු කර ඇත. එහෙත් ඔවුන් කළ වැඩ පිළිබඳ වාර්තාවක් එවීමට ඔවුනට හැකිවිය.

සොයාගැනීම්

මේ කැණීම්වලදී බහුල වශයෙන් වලන් කැබලිති හමුවූ අතර වීදුරු කැට හා කාසි සැලකිය යුතු ප්‍රමාණයක්ද, හමුවිය. රූප කලාව සම්බන්ධයෙන් සමුවූයේ කැබලි දෙකක් පමණකි.

සවන වළ.—හිරිගලින් නෙළූ බුද්ධ ප්‍රතිමා ශීර්ෂයක් රශ්මි මාලාවේ ශේෂයන් සමග ඉතා නොසැලකිල්ලෙන් සුරකින ලද මෙය සමුවූයේ අඩි 8 අඟල් 8ක් ගැඹුරිණි. මුහුණ දික් වර්ගයට අයත් වූවකි. හිරි ගලින්ම නෙලන ලද ප්‍රතිමාවක උරහිසක කැබැල්ලක් යට සඳහන් කෙරුණු ශීර්ෂයත් සමගම සමුවිය. එහෙත් එය ඒ ප්‍රතිමාවට අයත් නොවන බැව් පැහැදිලි ලෙස පෙනේ.

තුන්වන වළ.—මුදුන් මට්ටමේ සිට අඟල් 42ක් ගැඹුරින් කුඩා මැටි හිසක් සමුවිය. මුහුණේ දකුණු පැත්ත තදින්ම කැඩී බිඳී ගොස් ඇති අතර, දකුණු ඇස, නාසය හා මුඛය ද පෙනෙන් නට නැත. හිස් වැස්ම ඉතා කදිමය. නළලින් උඩට නැමුණු එය උස් පෙණයක හැඩය ගනී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හිස් කබලටම ඇලුණු රැළිගැසුණු හිසකෙස් ඇති මෙහි බැම වටේ එතුන පටිය කන්වලට පිටිපසින් කෙළවරවේ. මුහුණ ගොලාකාරය. ඉතිරිව ඇති වම් ඇස මඳ වශයෙන් එළියට විත් පස්සට ඇදී තිබේ. මුඛයෙහි ඉතිරිව ඇත්තේ සම්පූර්ණ යටිතොළ පමණකි. මනාව වටකුරුවූ කම්මුල්ද පිරුණු සිනිඳු ගතියක් දක්වයි. මේ ලක්ෂණ සියල්ල ගුප්ත යුගයෙහි දක්නට ඇති හෙයින්, මෙහි දැක්වුණු හිස ක්‍රි.ව. 5 වන හෝ 6 වන ශත වර්ෂයට අයත් එකක් ලෙස සිතිය හැක.

පළමුවන වළින් සොයාගත් වෙනත් දේවල්—

(1) පොළොව මතුපිට සිට අඩි 3 අඟල් 1ක් ගැඹුරින් රිදී කැබැල්ලක්.

(2) අඩි 5 අඟල් 6ක් ගැඹුරින් හඳුනාගත නොහැකි තුත්තනාගම් රෝම කාසියක්.

(3) අඩි 5 අඟල් 1 සිට අඩි 5 අඟල් 6ක් ගැඹුරින් සුදු පැහැති පිඟන් කැබැල්ලක්. දෙපැත්තෙහි රතු තිත් සහිත කැටයම් ඉරකින් මෙය අලංකාර වී තිබේ.

(4) අඩි 5 අඟල් 11 සිට අඩි 6 අඟල් 6ක් ගැඹුරින් තුත්තනාගම් පංචකෝණ කාසියක්.

(5) අඩි 6 අඟල් 6 සිට අඩි 6 අඟල් 11ක් ගැඹුරින් රත්රන් තහඩුවක කැබැල්ලක්.

(6) අඩි 11 අඟල් 7ක් ගැඹුරින් උළුකැට හතක්. උඩින්ම වූ උළු කැටය ප්‍රමාණයෙන් $12\frac{1}{4}'' \times 5\frac{1}{2}'' \times 7\frac{1}{2}''$ක් වේ.

දෙවන වළින්

(1) අඩි 5 අඟල් 9ක් ගැඹුරින් තුත්තනාගම් රෝම කාසියක්. මෙය පැහැදිලි නොවුවද, ක්‍රි.ව. IIවන ශත වර්ෂයෙහි අන්තිම භාගයේ ඇන්ටනි කෙනෙකුගේ යැයි සිතිය හැකි රැවුලකින් යුත් හිසක් ඇති බැව් හඳුනාගත හැක.

තුන්වන වළින්

(1) අඩි 18ක් ගැඹුරින් අලියකුගේ හා ස්වස්තිකයක සටහන් සහිත කාසියක්.

(2) අඩි 4ක් ගැඹුරින් අමරාවතී වර්ගයට අයත් හුණු ගල් කැබලි කීපයක්. මේවා අලංකාර කර ඇති බවට සලකුණක් නැත.

(3) අඩි 5 අඟල් 5ක් ගැඹුරින් රිදී කැබැල්ලක්.

(4) අඩි 6 අඟල් 4ක් ගැඹුරින් කෝච 5ක්.

සවන වළින්

(1) අඩි 6 අඟල් 9ක් ගැඹුරින් රෝමන් යැයි සිතිය හැකි තුත්තනාගම් කාසියක්.

(2) අඩි 7 අඟල් 3ක් ගැඹුරින් අඟුරු කැබලි. සෑම වළකින්ම නොයෙක් මට්ටම්වලදී වීදුරු කැට හමුවිය.

කුඹල් වැඩ

යට දැක්වුණු පරිදි වලන් කැබලිති රාශියක් සෑම වළකින්ම ලැබිණි. එක් එක් තට්ටුවලදී හමුවූ වර්ග හඳුනා ගැනීමට හැකිවිය :—

පළමුවන වළ

1 වන තට්ටුව.—අඩි 21 සිට 24 දක්වා ගැඹුරින්. රතු හා දුඹුරු පැහැති පිඟන් කැබලිති. විශාල භාජනවලට අයත් මේවායින් සමහරක් දැවී ඇත. තාච්චි කැබලි.

2 වන තට්ටුව.—අඩි 3 අඟල් 10 සිට අඩි 4ක් ගැඹුරින්. විශාල රතු පැහැති බඳුන්වල කැබලි. මේවායින් සමහරක ගැට්වලට යටින් රැළි දමා ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

3 වන තට්ටුව.—අඩි 4 සිට අඩි 5 අඟල් 3 දක්වා.

රත් පැහැති ඔප කරන ලද හෝ දුඹුරු පැහැති පිලිස්සුණු ඔප නොකරන ලද විශාල බඳුන් වල කැබලි. දුඹුරු පැහැති බඳුන්වල ඇඟිලි තුඩින් කෙරුණ කැටයම්, හඳුනාගත හැක. දෙවර්ගයෙන්ම බොහෝ විට කැටයම් කරන ලද පටි තිබේ. මේවා හැඩයෙන් වටකුරු වන අතර නොපළල් ගැට්වලින්ද යුක්තවේ. මේ භාජන විශාල වුවද නොගැඹුරුය.

4 වන තට්ටුව

අඩි 5 අඟල් 3 සිට අඩි 5 අඟල් 11 දක්වා ගැඹුරින්. විශාල දුඹුරු පැහැති බඳුන්ද මේ මට්ටමටම යටින් පිටතින් කළු පැහැතිවූත් ඇතුළතින් අළු පැහැතිවූත් පිඟන් කැබලිද බොහෝ විට හමුවිය. මේ තට්ටුවේදී සුදු පැහැති රත් පැහැයෙන් ඔප දැමුණු පිඟන් කැබලිද සමුවිය. ලංකාවේ ඒ වර්ගයට අයත් මැටි කර්මාන්තයට උදාහරණයක් වශයෙන් පෙන්විය හැක්කේ මෙය පමණකි. ගම්බද මැටි පාවිච්චි කර ඇති බැව් පෙනේ.

5 වන තට්ටුව

අඩි 5 අඟල් 11 සිට අඩි 7 දක්වා ගැඹුරින්. භාජන සංඛ්‍යාව මෙහිදී තව තවත් අධිකවේ. තැන් තැන්වල කැටයම් කරන ලද පිඟන් කැබලිති, විශාල භාජනවලට අයත් ඒවාය. මේ මට්ටමේදී නැමුණු ගැටි සහිත විශාල කෝප්පවල කැබලිතිද සමුවිය.

6 වන තට්ටුව

අඩි 7 සිට අඩි 8 අඟල් 6 දක්වා. ඇතුළත කැටයම් කරන ලද දුඹුරු පැහැති ලොකු බඳුන් වල කැබලිද, ගැඹුරු, නැමුණු ගැටි සහිත කෝප්ප වලට අයත් ඔප නොදැමූ කළු පැහැති පිඟන් කැබලිතිද මෙහි තිබී සමුවිය.

7 වන තට්ටුව

අඩි 8 අඟල් 6 සිට අඩි 10 දක්වා. දුඹුරු පැහැති පටු ගැට්වලින් හා සෘජු පැතිවලින් යුත් ලොකු බඳුන්, වඩා උසස් කුඹල් කර්මාන්තයට අයත් සාමාන්‍යයෙන් රත් පැහැති නො පිලිස්සුණු හෝ කළු පැහැති ඔප නොදැමූ හෝ ලොකු කෝප්ප.

8 වන තට්ටුව

අඩි 10 සිට 11 දක්වා. රත් පැහැයෙන් යුත් ඔප නොදැමූ තැන් තැන්වල කැටයම් සහිත වඩා හොඳ නොවූ වළන්, ඉතා මහත්වූ පැතලි ගැට්වලින් යුත් බේසන්වල හා ගොලාකාර බඳුන්වල කැබලි.

දෙවන වළ

අඩි 3ක් ගැඹුරට යන තෙක් පස් තට්ටුව හිස් එකකි.

1 වන තට්ටුව

අඩි 3 සිට අඩි 5 අඟල් 1 දක්වා. ප්‍රධාන වශයෙන් රතු හා දුඹුරු පැහැයෙන් යුත් ඔප නොදැමූ රළු කුඹල් වැඩ මෙහිදී සමුවිය. සමහර කැබලි පිළිස්සීමෙන් කළු පැහැ ගැන්වී තිබේ.

2 වන තට්ටුව.—අඩි 5 අඟල් 1 සිට අඩි 7 දක්වා.

ඇන්ටනි යුගයට අයත් යැයි සිතිය හැකි. තුත්තනාගම් රෝම කාසිය සමුවූයේ මෙම මට්ටමේදීය. මෙය ඉහළ තට්ටුවක සිට වැටී ඇති එකක් යැයි සිතිය හැක. කුඹල් වැඩ ඔප නොදැමූ රතු දුඹුරු පැහැයෙන් යුක්තය. කැටයම් සැරසිලි ඇත්තේ කලා තුරකිනි. මෙම තට්ටුවේදී, අනිකුත් ගම්බද වලන් කැබලිතිවලට වඩා වෙනස් පිඟන් මැටි වර්ගයකින් සැදුණු කැබලිති 2ක් ලැබිණි. ඉතා පිරිසිදු මැටියෙන් තැනුණු මේවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මනාලෙස පුළුස්සා, තද දුඹුරු පැහැති බදමකින් ඔපදමා ඇත. මීන් එකක කවයක හැඩයට තිත් දැමූ ගෝලාකාර සැරසිල්ලකි. පැතලිවූත් සිහින්වූත් මේ කැබලි දෙකම දීසිවලට අයත් විය හැක. මේවා ග්‍රීකයන් විසින් සෑදූ ඒවා විය යුතු අතර, එසේ නොවුවහොත් ග්‍රීක් බලපෑම් ලැබූ කම්හලක තැනුන ඒවා විය යුතුය. මේ වළන් කැබලිතිවල ග්‍රීක (Hellenistic) බලපෑමක් දිස්වේ. ක්‍රි.පූ. 1 වන ශත වර්ෂයේදී සුළු ආසියාවේ පිහිටා තිබුණ කම්හලක මේවා තැනුණු බැව් සිතිය හැක.

3 වන තට්ටුව.—අඩි 7 සිට අඩි 10 දක්වා.

කලින් තට්ටුවේ කුඹල් වැඩට සමානවූ මෙහිදී සොයා ගත් කුඹල් වැඩවල ඉතා පටු ගැට් වලින් හා පැතලි පතුලින් යුත් ලොකු පිඟන්, අඩි 10ක් ගැඹුරේදී කදිම වළන් කැබැල්ලක් සමුවිය.

මේ රත් පැහැති බදමක් ගාන ලද විශාල ගෝලාකාර පැතලි පතුලක් ඇති භාජනයක ගැටියක කොටසකි. භාජනය පිළිස්සූ පසු, තියුණු තුඩක් ඇති අවියකින් ලියන ලද ශිලා ලිපියක් එහි කරෙහි දක්වේ. මෙහි ඇත්තේ බ්‍රහ්මී අක්ෂරය. "ර ර ම" යනුවෙන් දැක්වෙනුයේ කුඹලාගේ සලකුණක් යැයි සිතිය හැක. මෙහි කාලය ක්‍රි. පූ. 1 වන ශත වර්ෂයටත්, ක්‍රි. ව. 1 වන ශත වර්ෂයටත් අතර විය යුතුය.

තුන්වන වළ

පොළොව මට්ටමේ සිට අඩි 4 දක්වාවූ පළමුවන තට්ටුවෙන් ඔප නොදැමූ සමහර තැන්වල රළු සැරසිල්ලෙන් යුත් රතු දුඹුරු පැහැති වර්ගයට අයත් කුඹල් වැඩ ලැබිණි.

2 වන තට්ටුව.—අඩි 4 සිට 5 දක්වා.

දුඹුරු, රතු, කළු හා රතු ඔප දැමූ කුඹල් වැඩ. කරේ සිට බඳ දක්වා තියුණු කෝණයකින් යුත් බඳුන් වර්ගයක් සමුවිය. මේවායේ ගැට් සිනිඳු ගැට පෙළකින් යුක්තය.

3 වන තට්ටුව.—අඩි 5 අඟල් 1 සිට අඩි 6 අඟල් 4 දක්වා.

මේ තට්ටුවේ ඉහළ කොටසේදී, බොහෝ විට රත් පැහැති ඔප නොදැමුණු සාමාන්‍ය කැටයම් සැරසිල්ලෙන් යුත් වළන් කැබලිද, අඩි 6 අඟල් 4ක් ගැඹුරේදී සිනිඳු ඔප දැමූ රත් පැහැති භාජනද, සිනිඳු ගැට්යෙන් හා පහත් පැතිවලින් යුත් පටු බඳුන්ද සමුවිය.

4 වන තට්ටුව.—අඩි 6 අඟල් 9 සිට අඩි 7 අඟල් 6 දක්වා.

රතු හා කළු පැහැති සාමාන්‍ය වර්ගයේ කුඹල් වැඩද, දෙවන ආවාටයෙන් සමුවූ ග්‍රීක් හෙලනික් වර්ගයේ කැබලිති කිහිපයක්ද, අඩි 5 අඟල් 9ක් ගැඹුරින් සොයාගත හැකි විය. මේවා දුඹුරු පැහැ වෙනුවට තද කළු පැහැයෙන් යුක්තය.

සවන වළ

1 වන තට්ටුව.—14″—3′

සිරිත් පරිදි උඩින්ම ඇති කුඩා පස් තට්ටුව නිසරුය. මෙහි අඟල් 14ක් යටින් පළමුවැනි වළේ තිබුණු කැබලිවලට සමාන රතු සහ දුඹුරු පාට මැටි භාජන කැබිලිති ස්වල්පයක් දක්නට ලැබිණ.

2 වන තට්ටුව.—3′—4′ 6″.

දුඹුරු සහ කළු පාටැති ඇතුල් පැත්ත පුලුස්සන ලද කැටයම් වැඩ දැමූ මැටි භාජන.

3 වන තට්ටුව.—4′ 6″—5′ 2″

ඉතා අලංකාර දුඹුරු පාටැති මැටි භාජන.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

4 වන තට්ටුව.—5′ 6″—8′.

මීට පෙර සම්භවූ අයුරුය. නමුත් කළු පාටැති කැබලිති සමූහයක් මෙහිවේ.

5 වන තට්ටුව.—8′—10′

ඉතාමත්ම රළු මැටි බඳුන්ය. මේම තට්ටුවේ සිට 8′ 8″ බුදු පිළිම හිසකි.

6 වන තට්ටුව.—10′—4″—11′—2″

මෙම තට්ටුවේ පෙනෙන්නට තිබුනේ උළු පමණකි.

මෙම කැණීමෙන් සොයාගත් නොයෙක් අන්දමේ මැටි බඳුන් ආදිය විශාල ගණනක් ලැබීතිබෙන ඒවා සම්බන්ධව දීර්ඝ පරීක්ෂණයක් කිරීමට අපහසු වී තිබේ. නමුත් මේවායින් සමහර කොටස් දනුදු අපට හඳුනාගත හැක. අඩි 10ක පමණ ගැඹුරේ පටන් ඉහළට සෑම තට්ටුවකම රතුපාටැති කැබිලිති සහ බඳුන් සමුවේ. නමුත් උඩ තට්ටුවේදී මේවා දක්නට ලැබුනේ කලා තුරකිනි. අඩි 5ක පමණ ගැඹුරේ සිට අඩි 9 දක්වා පියන්පත් නොමැති මැටි බඳුන් හමුවන්නට විය. කෙමිය සහිත බඳුන් අඩි 4 සහ 5 දීද සම්භවිණ. කාලය සම්බන්ධව මැන ගැනීමට පහත සඳහන් දේවල් උපකාරීවේ :—

අඩි 3·6″ ගැඹුරේදී මැටියෙන් කරන ලද හිසක්	...	ක්‍රි. ව. 5 සහ 6 වැනි සියවස
අඩි 5·9″ දුඹුරු පාට "ග්‍රීක්" කැබිලිති	...	ක්‍රි. ව. 1 වෙනි සියවස
අඩි 7·6″ කලු "ග්‍රීක්" කැබිලිති	...	ක්‍රි. ව. 1 වෙනි සිය වස
අඩි 10 අකුරු කෙටූ කැබිලිති	...	ක්‍රි. ව. පෙර 1 වෙනි සියවස

ක්‍රි. ව. පෙර 3 වැනි ශත වර්ෂයේ සිට ක්‍රි. ව. 1 වැනි ශත වර්ෂයේ මුල භාගය දක්වා ලංකාවේ පාවිච්චි කරන ලද ප්‍රමාණය ඇති අඟල් 18ක්වූ ගඩොල් පහත මාලයේදී සම්භවූ බැවින් ඉහත සඳහන් කාල පරිච්ඡේදය නිවැරදි බැව් පෙනේ.

සංරක්ෂණය

අනුරාධපුරය

බාහිර සමිති සමාගම් මගින් ශාස්ත්‍රීය නොවූ ප්‍රතිසංස්කරණයෙන් ඉදිකරන්නට තැත් කිරීම ඉතා ප්‍රඥ ගොචර ලෙස වලක්වන ලදි.

1957 වර්ෂයේ අවසාන භාගයේදී ඇතිවූ මහා ජලගැල්මෙන් පැරණි ස්ථම්භ සහ දෙපාර්තමේන්තු ගොඩනැගිලි ආදියට වූ අලාභහානි පසුගිය අවුරුද්ද වෙනුවෙන් ඉදිරිපත් කරන ලද පාලන වාර්තාවෙහි විස්තර කර ඇත. ගංවතුරෙන් අලාභ හානිවූ දෙපාර්තමේන්තුවේ සේවය කරන කම්කරුවන්ගේ නිවාස සහ පුරාවිද්‍යා ආරක්ෂිත ස්ථාන යථා තත්වයට ගෙන ඒම සඳහා බොහෝ බඩු බාහිරාදිය වියදම්වූවා පමණක් නොව විශාල මහන්සියක්ද දැරීමට සිදුවිය. එවැනි ගෙවල් අටක් සෑදූ අතර, ගංවතුරෙන් අනාථවූ කම්කරුවන්ට ආරක්ෂිත භූමිවල තාවකාලික ගොඩනැගිලි සාද ගැනීම සඳහා නොමිලයේ බඩු බාහිරාදිය සපයා ඒවා නොමිලයේ තනා ගැනීමටද සලස්වන ලදි.

දෙපාර්තමේන්තුවේ නිවාසවල පදිංචි කුලීකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා නව නගරයෙහි ලිඳක් කප්පවන ලදි.

1957 පාලන වාර්තාවෙහි 17 වැනි පිටුවෙහි සඳහන් පරිදි උතුරු දගැබ නොහොත් අභයගිරි දගැබට බටහිරින් රජමාලිගාවල තනා ඇති තාප්පය නැගෙනහිර සහ බටහිර පැති පාද අලුත්වැඩියා කරන ලදි. සොයාගනු ලැබූ මෙම තාප්පයේ සම්පූර්ණ දිග අඩි 44ක් පමණ ඇත. තාප්පය දකුණු පැත්තේ දෙරටුවකි. මෙම ස්ථානයේ දෙරටුව (III වෙනි චිත්‍රය) සහ පඩි පෙලක්ද, අලුත්වැඩියා කරන ලදි. උතුරු පැත්තේ වැඩද පටන් ගැනිණි. 1957 දී ආරම්භ කරන ලද කුට්ටන් පොකුණ සිට පන්කුලිය දක්වා විහිදෙන පාරට දකුණෙන් පිහිටි කපාරාරාමයේ බටහිර අන්තිම කෙළවරේ අළුත්වැඩියා කිරීමේ වැඩ නොකඩවා කරගෙන යන ලදි. නැගෙනහිර භාගයේ සිට මෙහි මධ්‍යය දක්වා විහිදි මාර්ගයේ අත්තිවාරම් සහ ඇතුල්වෙන ප්‍රධාන දෙරටුවද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාද අළුත්වැඩියා කිරීමට මත්තෙන් එය ගලවන ලදි. ඇතුල්වීමේ දෙරටුව අසල බටහිර දිගින් පන්කුලිය පාර හා සම සමව දිවෙන ගලින් බැඳි උසින් අඩි 4ක් වන තාප්පයක් අඩි 200ක් පමණ දිග කොටසක් මතුකර ගලවා තිබේ. මෙහි අත්තිවාරම බැඳ තිබෙන්නේ සිමෙන්ති බදාමයකිනි.

කුට්ටම් පොකුණේ දිය පිටවන අගලක් අඩි 300ක් දුරට මතු කැරින. වට රවුම් පාරේ සමාධි පිළිමය අසල තුබූ ගඩොල් බැම්මක් වසා සිටිනසේ ගොඩනැගිල්ල හාරා බලන ලද්දේ වටරවුම් පාරේ සිට සමාධි පිළිමය වෙත යන්නෙකුට එය හොඳින් දර්ශනයවීම පිණිසත් එම ගඩොලින් තැනූ ගොඩනැගිල්ල ආරක්ෂා කරන පිණිසත්ය.

ජලගැල්මෙන් අලාභ හානිවූ තිසාවැවේ ඉවුරට පහතින් පිහිටා තිබෙන රාජකීය උයනෙහි තිබෙන පොකුණෙහි ඉවුරු දෙක අළුත්වැඩියා කරන ලදි. එක් පොකුණක සිට තව පොකුණකට ගලා යන දියපාර හසුරුවාලීම පිණිස දෙරටුව සවිකොට ඇත්තේය.

ථූපාරාමය අසල පිහිටි පුරාවස්තුවල කාලිකෝව්ලයයි ප්‍රසිද්ධ ගොඩනැගිල්ලේද 1 වෙනි විජයබාහු රජුගේ මාලිගයේද ගඩොලින් කර ඇති කොටස් ශුද්ධ කරන ලදි.

මිහින්තලේ

දන ශාලාව :

කොට තාප්ප ශක්තිමත්ව තිබීම සඳහා පිටුපසින් කොන්ක්‍රීට් බැම්මක් සෑදවිය. මෙම තාප්පය දිගින් අඩි 34½ක්ද, උසින් අඩි 11ක්ද, අහල් 3ක් මහතින්ද යුක්තවේ.

කළුදිය පොකුණ :

උඩ සමතලාවට නගින පඩිපෙල අළුත්වැඩියා කරන ලදි (IV හා V වන චිත්‍ර). පොකුණ අසල දකුණු දෙරටුවට අයිති ගරාදි වැට මුරගල් ආදිය නියම ස්ථානයන්හි සවිකරනු ලැබීය. සමතලාවේ කෙළවර ගල්කුලට අඩි පහක් පමණ නුදුරිනි. ප්‍රථම පඩි පෙලට නැගෙනහිර දෙසින් දෙවැනි පඩි පෙල පිහිටා තිබේ. මෙම පඩි පෙලෙහි ගරාදි වැට හෝ මුරගල් නොතිබුන නමුත්, ඒ වෙනුවට යොද තිබෙන දිරාපත්වූ ගඩොල් බැම්ම සංරක්ෂණය කරනු ලැබීය. ගඩොලින් නිම කරන ලද සහ ගල් පතුරුවලින් බැඳි මුහුණුවරක් දෙන තාප්පයද සංරක්ෂණය කරනු ලැබීය. සමතලාවෙහි පිහිටි ජරාවාසවූ ගොඩනැගිල්ලක්ද සංරක්ෂණය කරනු ලැබීය (VI හා VII වන චිත්‍ර).

නාග පොකුණ :

සංරක්ෂණ කටයුතු පටන් ගන්නා ලද්දේ අවුරුද්දේ අන්තිම භාගයේය. මෙම පොකුණ ඉවුරේ ප්‍රථමයෙන් සවි කරන ලද පරෙවිගල් දනට පොකුණ පතුලට වැටී තිබෙන බැවින් ඒවා පහසුවෙන් ගැනීමට මෙහි ජලය හිස් කිරීම අදහස විය. මෙම කාර්යයට පොම්පයක් ඉතාම අවශ්‍යවූ බැවින් මේ අවුරුද්දේදී එය තාවකාලිකව නතර කිරීමට සිදුවිය.

මහා සෑය සංරක්ෂණය කිරීමේ කටයුතු නවතා එය ප්‍රතිසංස්කරණය සඳහා දී තිබුන කොන්ත්‍රාත්තුව අවලංගු කරන ලදි. මහා සෑයේ ප්‍රතිසංස්කරණ කටයුතු නිසියාකාර කළ යුත්තේ කෙසේදැයි සලකා බැලීමට ඉංජිනේරු මණ්ඩලයක් අමාත්‍යාංශය මගින් පත්කරනු ලැබීය. දෙපාර්තමේන්තුවට අයත් වර්ෂාවෙන් සේදීගිය පාරවල් බොරලු දමා සකස් කෙරිණ

සීගිරිය

පර්වත මුදුන :

පර්වත මුදුනේ දෙවැනි මහේ තාප්පයේ වැඩ භාර ගැනිණ. බැම්මේ නිරිත දිග සහ ඊසාන දිග පැතිවල සංරක්ෂණ කටයුතු සම්පූර්ණයෙන්ම කෙරිණි. පළමුවැනි සහ දෙවැනි මාර්ගයන් සම්බන්ධ කරන, නිරිත දිග කෙළවරේ පිහිටි පඩි පෙළක් (VIII වැනි චිත්‍රය) සංරක්ෂණය කරන ලදි. පාරෙහි අතුරා ඇති ගල් පතුරුවලින් සමහරක් නොතිබුනු බැවින් ඒ වෙනුවට ගඩොල් ඇල්ලීමට සිදුවිය. දෙවැනි පාරට උඩින් පිහිටි බැම්ම දිගින් අඩි 45ක් හා උසින් අඩි 4ක්ද සංරක්ෂණය කරන ලදි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිංහ වේදිකාව :

තද වර්ෂාව නිසා මෙහි නැගෙනහිර දිග බැම්මේ 35′×15′×5′ පමණ කොටසක් බිඳ හැලුණි. මේ කොටස සහ තවත් ගඩොලින් නිමි කොටස් තුනක්ද තත්වය අබලන් නිසා ප්‍රතිසංස්කරණය කරන ලදි. සිංහ රූපයෙහි සිදුරු හැදී තිබුනු බැවින් ඒවා හුණු සහ සිමෙන්ති බදමයෙන් පුරවන ලදි. රූපයෙහි පැලවී තිබුන වල් පැලැටි උදුරා ශුද්ධ කොට ගඩොල් බැම්මද ශුද්ධ කෙරිණි.

විනෝද උයනේ කැණීම් :

දකුණු දෙරටුවෙහි බටහිරින් පිහිටි ගඩොල් බැම්මේ පිටත වටයට නුදුරින් පොළව මට්ටමෙන් අඩි 2½ක් යටින් සොයාගත් අඩි 5ක් පළල ගල් වේදිකාවක් අඩි 140ක් පමණ දුරට පාද තිබේ. තද වර්ෂාව නිසා කපන ලද කානුව පසින් පිරිණ. එකතු වූ කුණු රොඩු ආදිය ඉවත් කළ යුතු විය. නිරිත දිගින් පිහිටි පොකුණ සැරීමේදී අඩි 90ක් දිග අඩි 12ක් පළල සාමාන්‍ය උස අඩි 4ක් පමණවූ සක්ක බැම්මක් මතුවිය. මෙම බැම්ම පෑදීමට පස් කියුබ් 45ක් පමණ ඉවත් කිරීමට සිදුවිය. මෙම බැම්ම නිසා පොකුණ බටහිර, නැගෙනහිර, යනුවෙන් කොටස් 2කට බෙදේ. බටහිර කොටස පතුලේදී අඩි 130ක් දිගින්ද, අඩි 83ක් පළලින්ද, උස අඩි 4කින්ද යුක්තය. ගඩොලින් කරන ලද පතුලකින් යුක්ත බටහිර පොකුණ නැගෙනහිර පස පොකුණට වඩා අඩි 1 අඟල් 6ක් පහලින් තනා ඇත. ක්‍රමයෙන් බසින අඟල් 3ක බැම්මක් සහිතව තනා තිබෙන මෙම පොකුණ පතුලේ ඊසාන දිග කොණේ දිය අගල දක්වා දිය බැසයාමට යයි සිතිය හැකි කුඩා දෙරටුවකි. නැගෙනහිර පොකුණෙන්ද, බැවුමේ තනා ඇති දිය අගලක් බටහිර පොකුණට වැටේ. නැගෙනහිර පොකුණ, පතුලේදී දිග අඩි 85ක්ද, පළල අඩි 41ක්ද, උස අඩි 5ක්ද වේ. නැගෙනහිර පොකුණේ මධ්‍ය භාගයෙහි ගඩොලින් නිමවන ලදැයි සිතිය හැකි ගොඩැල්ලක් තිබේ. බටහිර පොකුණේ නැගෙනහිර සහ බටහිර පැත්තෙන් පඩි පෙළවල් දෙකක්ද, දකුණු පසින් පොකුණේ මැද භාගයට වැටුනු පඩි පෙළක්ද වේ. නැගෙනහිර පොකුණේ නැගෙනහිර පසින් පඩි පෙලක් වේ. මෙම පොකුණ පෑදීමේදී ලැබුනු සාක්ෂි අනුව මෙම පොකුණ අවදි දෙකකදී තනා ඇති බව පෙනේ. කුඩා දිය අගල් සහ දිය ටැන්කි එකට සම්බන්ධකරවනසේ පොළොව යටින් තනා ඇති ගඩොලින් තැනූ කානු ගණනක්ම දකුණු දිග කොටුවේදී මතුවිය. මෙම කානු අඩි 462ක් පමණ මතු කරන ලදි. දකුණු කොටුවෙහි නැගෙනහිර පසට පිහිටා තිබෙන අඩි 30ක් දිග සහ අඩි 16ක් පළල ගඩොලින් කරන ලද ගොඩනැගිල්ලක් අඩි 12ක් ගැඹුරට සාරන ලදි. මෙය බටහිර භාගයෙන් සම්භවී පසුව සංරක්ෂණය කරන ලද ලිඳට සමාන ලිඳක් බව පෙනේ. විනෝද උයනේ සමාන දුරින් පිහිටා තිබෙන ගඩොල් බිත්තිවලට දකුණින් තිබෙන දිය අගල අඩි 2½ක් ගැඹුරට සහ අඩි 380ක් දිගටද හාරන ලදි. දිය අගල පිටින් පිහිටා තිබෙන සක්ක බැම්ම අඩි 225ක් දුරට පාදන ලදි. විනෝද උද්‍යානයේ සැලැස්ම සඳහා 1952 පාලන වාර්තාව බලන්න.

පුරාණ මාවත :

කඳු මුදුනට නගින පුරාණ පාර ලෙන අසල සිට අඩි 75ක් දිගට අඩි 5ක් පළලට සාරා ගෙන යන ලදි. මෙම පාරේ හුණු ගලින් සාද ඇති පඩි පෙලවල් 3ක් පාද හුණුගල් අඩුතැන් ගඩොල් යෙදීමෙන් පුරවනු ලැබී. පුරාණ මාවතට හැරෙන වංගුව අසලදී නැගෙනහිර පසින් සම්බන්ධ වන පටු මඟක් අඩි 145ක් දුරට පාදන ලදි. මෙහි පඩි පේලි 4ක් දක්ක හැක.

දිය අගලේ ඊසාන දිග කොටසේදී වටරවුම් පාර වතුරට සේදින. මෙය අළුත්වැඩියා කිරීම සඳහා පස් කියුබ් 45ක් පමණ යෙදීමට සිදුවිය. අවපට්ටම් පොකුණ අසල ඇති ලෙන දිරාපත්වූ ගඩොල් වෙනුවට අලුත්වා යොද සාදන ලදි. ලෙන අසල සියලුම කුඩා බැම් සංරක්ෂණය කෙරින.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආරක්ෂිත ප්‍රදේශයන්හි නඩත්තුව :

ආරක්ෂිත කොටස්වල නඩත්තුව සම්බන්ධයෙන් අපි විශේෂයෙන් සැලකිලිමත්වීමු. කඳු මුදුන් සහ විනෝද උයනේ වැවී තුබූ වල් පැලැටි, ගස් කොලන් ආදිය ශුද්ධ කරන ලදි. දිරාපත්වූ කණු වෙනුවට අළුත්වා යොදවා වැටවල් අළුත්වැඩියා කෙරිනි. පාරවල් සහ අඩි පාරවල් ආදිය සාමාන්‍යයෙන් සාදනු ලැබීය.

පෙරියකුලම :

දගැබ සංරක්ෂණය කිරීම පිළිබඳ වැඩ නැවත ආරම්භ කරණ ලදි. නමුත් හදිසි අවස්ථාව නිසා එය තාවකාලිකව අත්හිට වන්නට යෙදිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඕවර්සියර් මහතා ඇතුළු කම්කරු කණ්ඩායමක් අනුරාධපුරයට හා යාපනයට මාරුකරයවන්නට සිද්ධවිය. නමුත් අවුරුද්දේ අවසාන භාගයේදී සුළු කම්කරු පිරිසකගේ සහායයෙන් මෙම වැඩය නැවත පටන් ගන්නා ලදි.

යාපනය :

වර්ෂයේ මුල භාගයේදී ඇතිවුන මහා වර්ෂාව හේතුකොට ගෙන බන්ධනාගාරය පිහිටා ඇති ඕලන්ද කොටුවේ තාප්පයේ දිගින් අඩි 42ක් හා පළලින් අඩි 15.6ක කොටසක් බිඳ වැටුණේය. නමුත් මෙය එම වර්ෂයේදීම අළුත්වැඩියා කරණ ලදි. බන්ධනාගාරයේ පැරණි ඇඳිරි ගෙවල පියසිවලින් වැසි දිය කාන්දුවීම කරණ කොටගෙන ඒවා කඩාවැටීමේ ලකුණු පහළ වී තිබුණෙන් දිය කාන්දු නොවන පරිදි ඒවා පිළියම් කරන ලදි. පොලිස් භෝජනාගාරයට යාබදව ඇති බලකොටුවේ දකුණු පැත්තේ තාප්පයේ කොටසක්ද කඩා වැටීමේ භීතියට ලක්වී තිබුණෙන් එය ඉන් මුදවා ගැනීමට නිසි ප්‍රතිකාර කරන ලදි. දරුණු අන්දමින් වැසි දිය කාන්දුවෙමින් තිබුණ පුරාණ දෙව්මැදුරේ වහලයේ උළු මාරුකළ අතර එහිවූ දිරාගිය පීලි ආදිය අළුත්වැඩියා කරන ලදි. ස්ථානයේ පොදු පැවැත්ම හා ආරක්ෂාව උඩ බළකොටුවේ පවුර මුදුනේ බහුල ලෙස වැවී තිබුණු පැලැටි ආදිය උදුරා ශුද්ධකර දමන ලදි. මේ වර්ෂය තුළ යාපන දිස්ත්‍රික්කයේ දෙපාර්තමේන්තුවට අයත් තහනම් ඉඩම් හා ආරක්ෂිත පැරණි ගොඩනැගිලි ආදියද රැකබලා ගන්නා ලදි.

කල්පිටිය :

ඇතිවූ තද වර්ෂාව හේතුකොටගෙන කල්පිටියේ ඕලන්ද පල්ලියේ තාප්පයේ උඩට මහා කොහොඹ ගසක් කඩා වැටීම නිසා එම තාප්පයේ විශාල කොටසක් කැඩී ගියේය. මෙය අළුත්වැඩියා කිරීමේ කටයුතු වහා ක්‍රියාත්මක කළ අතර පල්ලිය හා බලකොටුවද අළුත්වැඩියා කරන ලදි.

පොළොන්නරුව :—

බද්ධ සීමා ප්‍රාසාදයෙහි බටහිර පැත්තේ ප්‍රධාන පවුර පාද තහවුරු කරන ලදි. (IX රූව) නැගෙනහිර හා බටහිර ප්‍රධාන පඩිපෙළට අතර පිහිටා ඇති තාප්පයේ දකුණු පැත්තේ වැඩ කටයුතුද කරන ලදි. ගිනිකොණ පැත්තේ පවුර ඇද වැටුණ අතර තවදුරටත් වියහැකිව තුබූ අලාභ හානි වැළැක්වීම සඳහා වහා පිළියම් කරන ලදි. තවද ඇද වැටුණ පවුර තහවුරු කිරීම වහා ආරම්භ කරන ලදි.

ගල්විහාරේ ප්‍රධාන වැවේ වැව් බැම්ම ගංවතුරෙන් බේරාගනු ලැබුවේ එහි පිටවාන කඩා හැරීමෙන්ය. පාරේ සෝදගිය තැන් පුරවා යථා තත්ත්වයට ගෙනඒම සඳහා කටයුතු කරන ලදි. රන්කොත් වෙහෙරේ ගර්භයෙහි බටහිර පැත්තේ කොටසක් කඩාවැටුණෙන් ඒ සුන්බුන් ඉවත් කර බිම් ප්‍රදේශය පවිත්‍ර කරන ලදි. චතුරශ්‍රයෙහි පිහිටා ඇති තාප්පයේ සක්ක අළුත් වැඩියා කළ අතර ථූපාරාමයේ වැසිදිය කාන්දුවෙමින් තිබුණු වහලයද හරි ගස්වන ලදි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බොහෝ කලක සිට අතපසු වෙමින් තිබුණ කම්කරු නිවාස පෙළ අළුත්වැඩියා කිරීමට පටන් ගන්නා ලදි. ගවයින් විසින් හානිකරන ලද ගඩොල් බැම්වල සක්ක පුරවන ලදි. පැරණි ගොඩනැගිලිවල වැවී තිබුණ වල්පැලෑටි ආදිය ශුද්ධ කළ අතර තහනම් ඉඩම් යථා පරිදි රැක බලාගන්නා ලදි.

යාපහුව :

අලංකාරවත් ද්වාර මාර්ගයට පිවිසෙන පඩිපෙළට 'නැගෙනහිර පැත්තේ ඇති ප්‍රාකාරය (X චිත්‍රය) තහවුරු කිරීමේ වැඩ පටන්ගන්නා ලදි. එයට අතිරේක වශයෙන් පඩිපෙලවල් දෙක ගැනද අවධානය යොමු කරන ලදි. ධාරානිපාත වර්ෂාව හේතුකොට ගෙන අලංකාර දොරටු මාර්ගයේ නැගෙනහිර පැත්තේ ප්‍රාකාරය කඩාවැටුනෙන් ඒ මතුපිට පොල් අතු වහලයක් ඉදිකර වර්ෂාවෙන් සිදුවෙන්නට තිබුණු තව අලාභ හානි වලක්වන ලදි. තවද මේ තාප්පය තහවුරු කිරීමේ වැඩද ආරම්භ කිරීමට විධිවිධාන යොදන ලදි. පර්වතය මුදුනේ පිහිටි මුළු ප්‍රදේශයෙහිම තිබූ පැලෑටි නෙලා දැමූ අතර එයට වැටී ඇති මාර්ගය සම්පූර්ණයෙන්ම ශුද්ධ පවිත්‍ර කරන ලදි. මේ පර්වතය වටා පිහිටි, දෙපාර්තමේන්තුවට අයිති පාර දෙපැත්තේ ඇති කාණු ගැඹුරු කිරීමෙන් හා වතුරට සෝද ගියතැන් පිරවීමෙන් අළුත්වැඩියා කරන ලදි. මේ අතර සමහර තැන්වල පාර පළල් කිරීමටද සිදුවිය. බළකොටුව වටා ඇති දිය අගලෙහි වතුර අයිරිස් අගල යටින් පිටතට කාන්දුවීමට පටන් ගත්තෙන් එය ශක්තිමත් කොන්ක්‍රීට් බැම්මක් බැඳීමෙන් තවදුරටත් ජලය නාස්තිවීම වලක්වන ලදි. තහවුරු කරණ ලද නටබුන්වල වැවී තිබුණ කුඩා පැලෑටි ආදිය ශුද්ධකර දැමීමෙන් ඒවා සාර්ථක ලෙස පවත්වාගෙන යන ලදි. ඕවර්සියර් මහත්වරුන්ගේ ජරාවාසවී තිබුණ නිවාස අළුත්වැඩියා කළ අතර තහනම් ඉඩම් යථා තත්ත්වයෙන් පවත්වාගෙන යෑමට හැකි සෑම උත්සාහයක්ම ගන්නා ලදි.

දැදිගම :

දගැබෙහි ගර්භයෙහි තිබුණ කුහරය පිරවීමේ වැඩ ආරම්භ කරන ලදි. නමුත් ධාතුගර්භයත්, ආකෘතියත් (සැලැස්ම) ඒ ඒ ස්ථානවල තැබීමට පෙර පස් හොඳාකාර ශක්තිමත්වීමට ඉඩහැරීම පිණිස පස්පිරවීමේ කටයුතු ටික කලකට පසු නවත්වන ලදි. ගර්භය පාමුල ඇති "නෙළුම් රාමු" තවදුරටත් සංරක්ෂණය කිරීමේ වැඩ නැවත පටන්ගත් අතර එම ගර්භයේම ගිනිකොන දෙස වෘත කණ්ඩයද තහවුරු කරන ලදි.

පඬුවස්නුවර :

මෙම වැඩපලෙහි වැඩ අතරමග නතර කිරීමට සිදුවිය. එයට හේතුව, මුදල් නොමැතිකමත් වැඩෙහි යෙදිසිටි කම්කරුවන් වෙන වැඩපලවල් කරා මාරුකර යැවීමත්ය. තවද එහි වැඩ කිරීමට ඉතිරිවූයේ ඉතා සුළු කම්කරු පිරිසකි. මෙහි සංරක්ෂණ වැඩ කිසිවක් කිරීමට නොහැකි. වූ අතර ගවයින් විසින් හානිකරන ලද පවුරු, මාලිගා හා දගැබෙහි කුස්තුර නැවත පුරවන ලදි. මෙම ප්‍රදේශය කටුකම්බි ගසා හොඳින් ප්‍රවේසම් කිරීමට වැඩපිළිවෙල යොදගෙන යනු ලැබේ. වර්ෂාව නිසා දිය අගලේ ඊසාන දිග පැත්තේ කොටසක් කැඩීගියෙන් එය නැවත පුරවා ප්‍රතිසංස්කරණය කරණ ලදි. තහනම් ඉඩම්වල පැලෑටි එලිපහලි කර දමන ලදින්, ඒවා යථා තත්ත්වයෙන් පවත්වා ගෙන යන ලදි.

මැදිරිගිරිය :

ගංවතුර නිසා මෙහි පාරට බොහෝ අලාභ හානි සිදුවිය. දෙපාර්තමේන්තුව මගින් සාදන ලද කව්ඩුළු ඔයේ පාලමේ තාප්පය ගංවතුරට ගරාවැටුන නමුත් පාලමට කිසිදු හානියක් නොවීය. මේවා ප්‍රතිසංස්කරණය කරණ ලදි. පාරේ සොදගිය තැන්වලට පස් දමා පුරවා යථා තත්ත්වයට ගෙන ආ අතර අලාභ හානිවූ බොහෝ කාණු සහිත බොක්කු නැවත ඉදිකරණ ලදි. මෙහිද සංරක්ෂණ වැඩ කිසිවක් නොකරන ලදි. පාර දෙපැත්තේ තිබූ කැලෑව කපා ශුද්ධ කළ අතර තහනම් ඉඩම් මැනවින් රැකබලා ගන්නා ලදි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තෙල්වත්ත රජමහ විහාරය :

මෙම ආරක්ෂිත ගොඩනැගිල්ලෙහි සුළු සුළු පිළියම් කරන ලදී.

ශ්‍රී සුමංගල නාහිමියන්ගේ නිජබිම :

මෙහි ඇති ගෙය (රක්ෂිත ස්මාරක) ඉතා ජරාවසව් තිබුණෙන් එය කඩාවැටීමෙන් වලක්වා ලීම පිණිස විශාල ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලදී. ප්‍රතිසංස්කරණය කරගෙන යන අතරතුර දැඩි වර්ෂාව නිසා ගොඩනැගිල්ලේ මුළුතැන්ගෙයි බිත්ති කඩාවැටිණ. මේ සමගම එයද ප්‍රතිසංස්කරණය කිරීමෙහිලා නිරතවිය. මෙය රැකබලා ගැනීම පිණිස මුරකරුවකුද ලහදී පත්කරන ලදී. මේ ගොඩනැගිල්ල ඇති ස්ථානය සම්පූර්ණයෙන් කම්බිගසා ආරක්ෂා කළ යුතු බව වැටහී ගොස් ඇත. එයට හේතුව, එහි ඇති පළතුරු ගස් ආදියට ළමයින් ගල්මුල් ගැසීම නිසා ගොඩනැගිලි වහලයට අලාභ හානි වෙන්නට ඉඩ තිබීමය.

පරීක්ෂණ හා ගවේෂණ

වයඹ පළාත

සියඹලාගමුව.—සිතියම් යොමුව අයි 9/23.

මේ ග්‍රාමයෙහි ඇති ගොවිපලෙහි විහාරයක් හා පන්සලක් තැනීම පිණිස සියඹලාගමුව ග්‍රාම සංවර්ධන සමිතිය විසින් අවසර ඉල්ලා සිටින ලදී. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් තහනම් කිරීමට බලාපොරොත්තුවන ඉඩම් ප්‍රදේශයට ඉහතකී ගොවිපලට අයිති ඉඩම් කැබැල්ල අයත් නොවන බැවිනුත් සැලකිය යුතු පුරාවිද්‍යාත්මක දේ ඒ ප්‍රදේශයේ නොමැති බැවිනුත් යථෝක්ත සමිතියේ ඉල්ලීම කුරුණෑගල දිසාපති තුමාගේ මාර්ගයෙන් ඉටුකරණ ලදී.

මහ අන්දර වැව.—සිතියම් යොමුව ඇෆ්. 18/43.

වන්නි හත්පත්තුවේ මහ අන්දර වැවේ බැම්මට ඉතා ආසන්න මහ වනයේ විසිරී පවතින නටබුන් රාශියක් පිළිබඳව ප්‍රවෘත්තියක් කුරුණෑගල දිසාපතිතුමාගෙන් හා රාජාංගනේ (ඇස්.ඩී) වාරිමාර්ග ඉංජිනේරු මහතාගෙන්ද දැනගන්නට ලැබුණේය. අක්කර පහක පමණ ප්‍රදේශයක පහත සඳහන් නෂ්ටාවශේෂ දක්නට ලැබේ—කුළුණු වලින් තැනූ ශාලාවක්, ගල් කුලුණුවලින් වටවූ ආයතචතුරශ්‍රාකාර පස් ගොඩැල්ලක්—සිවදේවාලයක් තිබූ බවට සාක්ෂි වශයෙන් ගත හැකි යෝනිගලක් එහි තිබී සම්භවීම, භාරන ලද දගැබක්, ගඩොල් හා ගඩොල් කැබිලිති හා මැටි බඳුන් කැබිලිති ආදියය. මේ නෂ්ටාවශේෂ අතර තිබී සම්භවුන සාමාන්‍ය ගඩොල් කැටයක පරිමාණය අඟල් $8\frac{1}{2}\times 8\times 2\frac{1}{2}$ක් විය. තවද මේ ප්‍රදේශය මිනිසුන්ගේ පදිංචිය සඳහා කිසිවෙකුට පවරා නොදෙන ලෙසත් පුරාවිද්‍යා තහනම් ප්‍රදේශයක් හැටියට වෙන්කර තබන ලෙසත් දිසාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

වැල්ලගිරිය.—සිතියම් යොමුව අයි 3/11.

වැල්ලගිරියේ පදිංචිකරුවෙකුගෙන් ලැබුණ ආරංචියක් අනුව පැරණි ස්ථානයක් පරීක්ෂාකර බලන ලදී. මෙය පිහිටා ඇත්තේ වැල්ලගිරිය වැවට උතුරු පැත්තේ දුදුරු ඔයේ වම් ඉවුරේ ඝන කැලෑවේය. පෙනෙන්නට ඇති නටබුන් අතර ගල් කුලුණුවල කැලි වලින් ගහන චතුරශ්‍රාකාර පස් කණ්ඩියක් තිබේ.

තරකුඩිවිල්ලු.—සිතියම් යොමුව අයි 21/55.

හලාවත-පුත්තලම් මහා මාර්ගයේ සැතැපුම් හතරකට නැගෙනහිරින් පිහිටි තරකුඩිවිල්ලු ප්‍රදේශයේ තිබී ගඩොල් කැබිලිති වලින් යුක්ත කවාකාර පස් කණ්ඩියක් සොයාගන්නා ලදී. මෙය පැරණි දගැබක නෂ්ටාවශේෂයෝය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොටලකෙඹියාව.—සිතියම් යොමුව අයි 4/59.

කොටල කෙඹියාවේ විෂම කඳු බෑවුම මත කොටන ලද කටාරම්වලින් හා ශිලා ලේඛන වලින් යුක්ත ගල්ලෙන් ගණනාවක් පිහිටා තිබේ. කරණ ලද පරීක්ෂණයෙකින් පසු මේ ගල් ගුහාවලින් දෙකක මෙහෙණින් වහන්සේලා පදිංචිවී සිටින බව අනාවරණය විය.

මොරගල්ල විහාරහින්න.—සිතියම් යොමුව අයි 4/16.

උතුරු මාතලේ කන්දපල්ල කෝරලයේ පිහිටි ඉහත සඳහන් ස්ථානයේ නටබුන් ඇති ප්‍රදේශය අක්කරයක් පමණ විශාලය. මේ නටබුන් අතර ප්‍රධාන වශයෙන් දගැබක නෂ්ටාවශේෂද, සාමාන්‍ය පොළව මට්ටමේ සිට අඩි 6ක් පමණ ගැඹුරට නිධන් හොරුන් විසින් කණින ලද ගල් කුලුණු සහිත දිගටි අත්තිවාරමක්ද තිබේ. මේ වළේ වැටී තිබී බෙල්ල ලඟින් වෙන්වූ ගල් බුදු පිළිමයක් සොයා ගන්නා ලදි. තවද මෙම ස්ථානයේම තිබී සොයාගත් බාගෙට මැකීගිය දෙමළ සෙල්ලිපි පුවරුවක් දෙපාර්තමේන්තුව විසින් පිටපත් කරගන්නා ලදි. යොමුව—පුරාවිද්‍ය පුවත් 1911—12 පිටු 121 හා පුරාවිද්‍ය මුල් පිටපත් කාණ්ඩ 4 පිටු 170. කරුණු මෙසේ හෙයින් මෙම ඉඩම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලබාගැනීමට සිතයොමුකර තිබේ.

මැදවක්කුලම.—සිතියම් යොමුව අයි 2/43.

මෙගම වැසියෙකුගේ ඉල්ලීම පරිදි කුඩා දගැබක නෂ්ටාවශේෂයන් හා ගල් පර්වතයක් කරා වැටී තිබෙන පඩි පෙලක්ද පරීක්ෂා කරන ලදි. මෙම නටබුන් වලට හිතාමතා කිසිදු හානියක් කර නොමැත.

ගනේකන්ද විහාරය.—සිතියම් යොමුව ඇf්ප් 24/61.

මෙය පුද්ගලයකු සතු විහාරයක්වූ අතර එම විහාරය පිහිටි ඉඩම නොසලකා හැර තිබේ. දගැබද සොරුන්ගේ කොල්ලකෑමට ලක්වී තිබේ. මෙම ස්ථානයට අතිරේක වශයෙන් දෙරබාවිල විජයසුන්දරාරාමයේ ආරක්ෂිත ස්මාරක සහ අරංකැලේ පුරාවිද්‍යා තහනම් ඉඩම්, රාජංගනේ හා නිල්ලක්ගම ආදී ස්ථාන පරීක්ෂාවට භාජන කරණ ලදි. ඉහතදී කරන ලද පරීක්ෂණවලට අයත් නොවූ දගැබක නටබුන් ඇති ඉඩම් කැබැල්ලක් (ඇf්ප්. වයි. පී. හි ලොට් 42, බී) පඩුවස්නුවර ප්‍රධාන පුරාවිද්‍යා තහනම් ඉඩම්වලට යාකිරීමට වැඩ පිළිවෙල යොදන ලදි.

උතුරුමැද පළාත

කැබිතිගොල්ලෑව.—සිතියම් යොමුව සී. 20/55.

කැබිතිගොල්ලෑව-මැදවච්චිය පාරේ 9/2 සැතපුම් (මයිල) කණුව අසල බෝක්කුවක් බැඳීම සඳහා සෙල්ලිපියක් සහිත ගල් කණුවක් පාවිච්චිකර තිබේ. මෙය අනුරාධපුර කෞතුකාගාරයට ගෙන ඒම පිණිස, එම බෝක්කුවෙන් ඉවත්කර දිය යුතුයයි ප්‍රසිද්ධ වැඩ පිළිබඳ අධ්‍යක්ෂකතුමාගෙන් ඉල්ලා සිටින ලදි.

දියතිත්තවැව.—සිතියම් යොමුව ජී.—1/15.

අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි හුරුළුපළාතේ දියතිත්ත වැවට උතුරෙන් පිහිටා තිබෙන කැලෑ ප්‍රදේශයෙහි පුරාවස්තු සෙවීම ආරම්භ කරන ලදි. එහිදී දිරාපත්වී කුඩු වැස්සෙන්නාවූ රාක්ක සහිත ගල් ගෙවල් හා බ්‍රාහ්මී සෙල්ලිපි ආදියද සොයාගන්නා ලදි. මෙහිදී සොයාගනු ලැබූ ගල් ගෙවල් වලින් ගල් ගෙවල් තුනක වහළ බදම ගා අළුත්වැඩියා කරන ලද නමුත් ඒවා පරීක්ෂා කිරීමේදී දක්නට ලැබුණේ කැබෙලි පමණකි. මෙම ගල් ගෙවල් වල දෙරටු හොඳින් බඳනා ලද ප්‍රාකාර වලින් ආරක්ෂා කොට තිබුණි. මෙම ප්‍රාකාර බොහෝ දුරට නටබුන් තත්ත්වයක තිබුණු නමුත් එක් ප්‍රාකාරයක පමණක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලිස්තර රූප හා සැරසිලි යනාදිය තරමක් දුරට ආරක්ෂාවී ඇති බැව් පෙනී ගොස් තිබේ. මෙකී ප්‍රාකාර පිහිටා ඇති භූමිය ගොවිජනපද සඳහා බාර නොගන්නා ලෙස ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි තැනගෙන් ඉල්ලුම් කරන ලදි.

රනාව.—සිතියම් යොමුව ඇ/ජ්. 25/19.

නාකැලේකන්ද නමැති කඳු මුදුනක පිහිටා ඇති "වේදිකා දෙකක්" එක්තැන් කලාක් මෙන් දිස්වන ගොඩනැගිලිවල නෂ්ටාවශේෂ පරීක්ෂා කිරීමේදී එම ගොඩනැගිලි සෑදීමේදී රළුගල් බහුල වශයෙන් යොදගෙන තිබෙන බැව් පෙනී ගියේය. මෙම ගොඩනැගිලි අරන්කැලේ හා මනකන්දේ පිහිටා ඇති ගොඩනැගිලිවලට සමාන විය. වෙහෙර බැදිගල, මනකන්ද, දිඹුලාගල හා තන්තිරිමලේ යන පුරාවිද්‍යා අංශයන්ද පරීක්ෂා කරන ලදි. දිඹුලාගල පිහිටා ඇති නෂ්ටාවශේෂ වටා ඇති කලැ ප්‍රදේශය පිරිසිදු කිරිම හා ජීප්රථ යන එන මාර්ගය එලිකිරීමද තවදුරටත් කරගෙන යනු ලැබේ.

දකුණු පළාත

වරාපිටිය.—සිතියම් යොමුව ඕ. 15/45.

සිය ගම් ප්‍රදේශයේ දගැබක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වරාපිටියේ චෛත්‍යවර්ධන සමිතිය අවසර ඉල්ලිය. මෙම දගැබ ගඩොල් හා රළු ගල් වලින් බඳනා ලද්දක් බවත් එය අවට වෙනත් නෂ්ටාවශේෂ නොමැති බවත් යථෝක්ත සමිතියේ නිලධාරීන් සමග දගැබ පරීක්ෂා කිරීමේදී පෙනී ගියෙන් දගැබ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවසර දෙන ලදි.

ගිරිහඬු විහාරය.—සිතියම් යොමුව පී. 17/29.

අම්බලන්තොට ගිරිහඬු විහාරයෙහි පන්සල් භූමිය ඉදිරිපිට ඇති තානායම පිහිටා තිබෙන භූමිය විහාරයට බාරදෙන මෙන් එම විහාරාධිපති හිමියෝ ඉල්ලීමක් කළහ. මෙම භූමි භාගය පුරාණයෙහි මෙම විහාරයට අයත්ව තිබුණු බැව්ද කියන ලදි. භූමිය පරීක්ෂා කිරීමේදී එහි බොහෝ පැරණි ගොඩනැගිලිවල නෂ්ටාවශේෂයන් ඇති බැව් පැහැදිලි විය. 1939 වර්ෂයේදී මේ ස්ථානයෙහි බුද්ධ ප්‍රතිමාවක් සහිත මලසුන් ගෙයක් හා වෙනත් පැරණි වස්තු තොගයක්ද සොයාගන්නා ලදි. මෙම භූමිය ලබාගෙන එය පුරාවිද්‍යා අංශයක් බවට පත්කොට එහි ඇති තානායම් ගොඩනැගිල්ල දකුණු පළාතේ පුරාවස්තු ආරක්ෂා කොට තැබීම සඳහා කෞතුකාගාරයක් හා සංචාරක මධ්‍යස්ථානයක් බවට පත්කිරීමේ කර්තව්‍යය සැළකිල්ලට භාජන වී තිබේ.

ඉහල කුඹුක්වැව.—සිතියම් යොමුව පී. 7/29.

ඉහල කුඹුක් වැව විහාරය විශාල කිරීම සඳහා ඉඩමක් බදුදෙන මෙන් එම විහාරයේ භාරකාර හිමියෝ ඉල්ලීමක් කළහ. මෙම ඉඩම පරීක්ෂා කිරීමේදී එහි පැරණි දිග ගොඩනැගිල්ලක කුළුණු මුල් කීපයක් පමණක් ඇති බැව් පෙනී ගියෙන් යථෝක්ත ඉල්ලීමට අවසර දෙන ලදි.

අගලකඩ පුරාණ මහා විහාරය—අකුරැස්ස

මෙම විහාරයේ දගැබ පිහිටි ස්ථානය සමතලා කිරීමේදී එහි විහාරාධිපතීන් වහන්සේ විසින් සෘජු කෝණාකාර ගොඩනැගිල්ලක අත්තිවාරමක් හා වෙනත් ගෘහනිර්මාණ ශිල්පය පිළිබඳ වස්තු කීපයක්ද, සොයාගෙන තිබේ. මෙම වස්තු තුබූ භූමිය දගැබේ අත්තිවාරමට වඩා උස් මට්ටමක පිහිටියේය. මෙම ප්‍රදේශය වටා ප්‍රාකාරයක් තිබුණු බැව්ද පෙනී ගොස් තිබේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳමිණි වෙහෙර.—සිතියම් යොමුව 25/60.

සඳමිණි වෙහෙර පිහිටා ඇති ඉඩම මුහුදු බඩ පෙදෙසක වූ සාරවත් භූමි භාගයකි. එහි ගඩොල් ගොඩැල්ලක් හා වෙනත් ගල් විශෙෂයක්ද ඇත. මෙම ඉඩමෙහි ඇති නෂ්ටාවශේෂයන් වටා නිවාස පේළි ඉදි කිරීමෙන් එම ඉඩම අන් සතු වී ඇතැයි පුරාවිද්‍යාව අතින් බලන විට පෙනීයයි. පෞද්ගලික ඉඩමක් වන මෙය සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ක්‍රියාකිරීම අනවශ්‍යය.

රිදියගම.—සිතියම් යොමුව පී. 12/44.

රිදියගම වැවේ වෙල්ලේ පැරණි දගැබක නෂ්ටාවශේෂයන් ඇතැයි වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරන ලදි. මෙම චෛත්‍යය යථෝක්ත වැව සමීපයෙහි ඇති එකම චෛත්‍යය බවත් වස්තු සොයා ඇවිදින්නන් විසින් කිළුටු නොකරන ලද බවත් පරීක්ෂණයේදී හෙළිවිය. මෙම දගැබ දැන් පවත්නා තත්ත්වයෙහිම තබන මෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කරන ලදි.

වඳුරුප්පු විහාරය.—සිතියම් යොමුව පී. 17/29.

